**කොළඹ මහා නගර සභාව**
**නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව**
**2026 වර්ෂය සඳහා කොන්ත්‍රාත්තුකරුවන් ලියාපදිංචිය - දෙවන අදියර**

2026 වර්ෂය සඳහා කොළඹ මහා නගර සභාවේ ලියාපදිංචිය සඳහා කොන්ත්‍රාත්කරුවන් වෙතින් අයදුම්පත්‍ර නැවත කැඳවනු ලැබේ. පහත සඳහන් ලැයිස්තුවේ{අයිතමය (i) සිට (viii) දක්වා} ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) දැනටමත් ලියාපදිංචි වී ඇති සහ වලංගු ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් සහිත පහත සඳහන් කාණ්ඩවල කොන්ත්‍රාත්කරුවන්ට, කොළඹ 07, නගර ශාලාව, කොළඹ මහා නගර සභාවේ ව්‍යාපෘති කළමනාකරණ අංශයේ පහත සඳහන් ඉදිකිරීම් ක්ෂේත්‍ර තුළ සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ශ්‍රේණිවලට අනුකූලව ලියාපදිංචි වීමට ඉල්ලුම් කළ හැකිය. 2026 වර්ෂය සඳහා දැනටමත් ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්, මෙම 2026 (අදියර ii) ලියාපදිංචිය සඳහා අයදුම් කිරීම අවශ්‍ය නොවන්නේය.

I. CIDA C9 සහ C8 ශ්‍රේණිවල ගොඩනැගිලි ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්
II. CIDA C9 සහ C8 ශ්‍රේණිවල ජල සැපයුම් සහ ජලාපවහන කොන්ත්‍රාත්කරුවන්
III. CIDA C9 සහ C8 ශ්‍රේණිවල වැසි ජල පද්ධති කොන්ත්‍රාත්කරුවන්
IV. CIDA හි SP/F ශ්‍රේණියේ ඇලුමිනියම් සහ නිම කිරීම් කොන්ත්‍රාත්කරුවන්
V. CIDA හි SP/F ශ්‍රේණියේ බිම, බිත්ති, සිවිලිම නිම කිරීම් කොන්ත්‍රාත්කරුවන්
VI. CIDA හි SP/F ශ්‍රේණියේ භූමි අලංකරණ කොන්ත්‍රාත්කරුවන්
VII. CIDA හි EM ශ්‍රේණියේ විදුලි ස්ථාපන කොන්ත්‍රාත්කරුවන් (අඩු වෝල්ටීයතාව/මධ්‍යම වෝල්ටීයතාව)
VIII. CIDA හි SP ශ්‍රේණියේ ජල ආරක්ෂණ සඳහා කොන්ත්‍රාත්කරුවන්
IX. ස්මාරක මූර්ති (කිරිගරුඬ, ග්‍රැනයිට්, ටෙරාසෝ, කොන්ක්‍රීට් ආදිය) සැපයීම සහ ස්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් - CIDA ශ්‍රේණිය අදාළ නොවේ.
X. ගස් කැපීමේ කොන්ත්‍රාත්කරුවන් - CIDA ශ්‍රේණිය අදාළ නොවේ.

කොළඹ මහා නගර සභාවේ ව්‍යාපෘති අංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති/කාර්ය සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් සැදැහුම් ක්‍රමය/මුද්‍රා තැබූ මිල ඉල්ලීම් (RFQ) අනුව සිදු කිරීමට අදහස් කරයි.

1) 2026 කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා වන අයදුම්පත (අදියර ii), ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී, ව්‍යාපෘති කළමනාකරණ අංශය, නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, නගර ශාලාව, කොළඹ - 07 වෙතින්,2026-06-03 දක්වා කාර්යාලීය දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා ආපසු නොගෙවනු ලබන ලියාපදිංචි ගාස්තුව වන රු.1,000.00+ VAT, මුදලින් ගෙවීමෙන් මිලදී ගත හැකිය.
2) කොළඹ මහා නගර සභාව විසින් අසාදු ලේඛන ගත කල කොන්ත්‍රාත්කරුවන් වෙත අයදුම්පත් නිකුත් කරනු නොලැබේ. මිල ගණන් කැඳවීම (RFQ) සම්බන්ධයෙන් අඛණ්ඩව තුන් වතාවක් (03) ප්‍රතිචාර නොදක්වනු ලබන ඕනෑම කොන්ත්‍රාත්කරුවෙකු, කොළඹ මහා නගර සභාවේ ව්‍යාපෘති කළමනාකරණ අංශයේ ලියාපදිංචි ලැයිස්තුවෙන් ඉවත් කරනු ලැබේ.
3) අදාළ ලියකියවිලි සමඟ නිසි පරිදි සම්පූර්ණ කළ අයදුම්පත්, 2026-06-05 දින සවස 3.30 ට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ඉංජිනේරු (ව්‍යාපෘති), ව්‍යාපෘති කළමනාකරණ අංශය, නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, නගර ශාලාව, කොළඹ-07 යන ලිපිනයට (අතින්) භාර දීම හෝ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. මුද්‍රා තැබූ ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ "2026 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම (අදියර ii)" යනුවෙන් සඳහන් කරමින් අධ්‍යක්ෂ ඉංජිනේරු (ව්‍යාපෘති) වෙත ඉදිරිපත් කළ යුතුය.
4) කිසිදු ලේඛනයක් ඉදිරිපත් නොකිරීම හෝ අර්ධ වශයෙන් ඉදිරිපත් කිරීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතු විය හැකිය. එක් එක් කාණ්ඩය සඳහා ලියාපදිංචි ගාස්තුව සඳහා රු. 2000.00 + VAT ලියාපදිංචි කිරීමේදී ගෙවිය යුතු වේ.
5) අයදුම්පතෙහි සඳහන් විස්තර සහතික කිරීම සඳහා අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. සියලුම සහතිකවල/සහාය ලේඛනවල මුල් පිටපත් හෝ සහතික කළ සත්‍ය පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

මේ පිළිබඳ වැඩිදුර විස්තර ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී, ව්‍යාපෘති කළමනාකරණ අංශය, නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, නගර ශාලාව, කොළඹ 07 හි දුරකථන අංකය 0112691191 (දිගුව 260) හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඉංජිනේරු (කොන්ත්‍රාත්) දුරකථන අංකය 0112675591 ඇමතීමෙන් ලබා ගත හැකිය.

**ඒ.ඩී.එස්.රෝහණ,**
**නාගරික කොමසාරිස් (ස.භා)**
**කොළඹ මහා නගර සභාව.**